SRI LANKA
histories that connect
සබැඳි ඉතිහාසය
இணைந்த வரலாறுகள்

# ඉතිහාස විෂයයට අදාළ දෘශ්‍ය කුසලතා




COLLECTIVE FOR HISTORICAL DIALOGUE & MEMORY
EuroClio Inspiring History and Citizenship Educators
SCOPE Strengthening Social Cohesion and Peace in Sri Lanka
Co-funded by the European Union
german cooperation DEUTSCHE ZUSAMMENARBEIT
Implemented by: giz Deutsche Gesellschaft für Internationale Zusammenarbeit (GIZ) GmbH

# Acknowledgements


## Author

Iraj De Alwis

With special thanks to Shavindi Pieris and Johann Peiris (Collective for Historical Dialogue and Memory) for help with archival research and coordination.

## Published by

EuroClio - European Association of History Educators as part of the project *Histories that Connect Sri Lanka II*



## Copyright

CC BY 4.0



## To cite this publication:

De Alwis, I. (2025). Visual Skills in the History Classroom. *EuroClio - European Association of History Educators.*

## Supported by

*This publication was supported by the Strengthening Social Cohesion and Peace in Sri Lanka (SCOPE) programme. SCOPE is co-funded by the European Union and the German Federal Foreign Office and implemented by GIZ in partnership with the Government of Sri Lanka. The content of the publication does not represent the official position of the European Union, the German Federal Foreign Office, GIZ, or the Government of Sri Lanka.*

# ඉතිහාස විෂයයට අදාළ දෘශ්‍ය කුසලතා

අප ජීවත්වන වර්තමාන ලෝකයේ, එදිනෙදා සංසරණය වන තොරතුරුවලින් අතිමහත් බහුතරයක් ග්‍රහණය කර ගන්නේ පෙළ (text) මගින් නොව, දෘශ්‍ය රූප (image) මගිනි. මෙයට ගැළපෙන පරිදි අපගේ අධ්‍යාපන ක්‍රමය හැඩගැස්වීමට ඇති හදිසි අවශ්‍යතාව පිළිබඳ දැඩි තර්ක කිරීම් අවශ්‍ය නොවේ. අපගේ සිසුන් ලෝකය ගැන ඉගෙන ගන්නේ දැන්වීම් පුවරුවක, රූපවාහිනී තිරයක, මැතිවරණ පෝස්ටරයක, මීම් (meme) එකක හෝ ඇල්ගොරිතම මගින් තම අතේ ඇති ඉලෙක්ට්‍රොනික උපාංගයක් මත නිර්මාණය කරන ගණනය කළ නොහැකි තරම් දෘශ්‍ය රූපවලින් එකක් ඇසුරෙනි. යමක් පිළිබඳ විශ්වාස කිරීමට ඇසින් දැකිය යුතු යැයි ඔවුහු පවසති; සංජානනයෙන් හා සංස්කෘතික වශයෙන් අපි දෘශ්‍ය රූපයක් සත්‍යයක් ලෙස විචාරයකින් තොරව පිළිගැනීමට බොහෝ දුරට ඉඩ ඇත. අපි සිසුන් කියවන සහ අසන දේ ප්‍රශ්න කිරීමට පුහුණු කරනවා සේම, ඔවුන් දකින දේ ප්‍රශ්න කිරීමට හා විමසුමට ලක් කිරීමට අපි ඔවුන්ට ඉගැන්විය යුතුය. රූපයක මූලික විසංයෝජනයේ සිට, සාමාන්‍ය දෘශ්‍ය උපාංග විශ්ලේෂණය කිරීම මගින්,  අවසාන වශයෙන් රූපයක නිර්මාණකරු එහි අර්ථය හිතාමතාම සැකසූ ආකාරය විමර්ශනය කිරීම දක්වා - දෘශ්‍ය විශ්ලේෂණයේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා පාඩම් සැලසුම් කරන්නේ කෙසේද යන්න පිළිබඳ ගුරුවරුන්ට අදහස් කිහිපයක් සැපයීමට මෙම මාර්ගෝපදේශයෙන් බලාපොරොත්තු වේ.

## සාමාන්‍ය දෘශ්‍ය විශ්ලේෂණ කුසලතා අවශ්‍ය වන්නේ ඇයි?

**උසස් මට්ටමේ චින්තන කුසලතා (Higher Order Thinking skills):** දෘශ්‍ය විශ්ලේෂණ කුසලතා වර්ධනය කිරීමෙන් සිසුන්ගේ උසස් මට්ටමේ චින්තන කුසලතා සහ සහයෝගී ක්‍රියාකාරිත්වය වර්ධනය වේ. ඇතැම් අධ්‍යයනවලින් පෙනී යන්නේ, දෘශ්‍ය විශ්ලේෂණය සමග නිරන්තර සම්බන්ධතාවයක් පැවැත්වීමෙන්, පෙළ විශ්ලේෂණයට සාපේක්ෂව, වර්තමාන සිසුන් අතර උසස් මට්ටමේ චින්තන කුසලතා වේගයෙන් වර්ධනය වීමට හේතු වන බවයි.[1] දෘශ්‍ය මාධ්‍ය, තොරතුරු ග්‍රහණය කර ගැනීමේ ප්‍රධාන ක්‍රමය වීම මෙයට හේතුව විය හැකිය; සිසුන් චිත්‍රපටයක හෝ දුරකථන තිරයක දක්නට ලැබෙන දේවල් පිළිබඳ සාකච්ඡා කරන විට, පන්ති කාමරයේදී ඉගැන්වූ දෘශ්‍ය විශ්ලේෂණ කුසලතා ස්වභාවිකවම භාවිත කරයි. දෘශ්‍ය මාධ්‍ය කුසලතා පිළිබඳ පුහුණුව සිසුන්ගේ වාචික සහ ලිඛිත කුසලතාවන්හි ද කැපී පෙනෙන වර්ධනයක් ගෙන දෙන බව අධ්‍යයනයන්ගෙන් පෙන්වාදී ඇත. එසේ වන්නේ, එය උසස් මට්ටමේ චින්තන කුසලතාවන් වේගයෙන් වැඩිදියුණුවීමේ ප්‍රතිඵලයක් ලෙස විය හැකිය.[2] තවද විශාල සිසුන් සංඛ්‍යාවක් අතර ක්‍රියාකාරී පසුවිමසුම් කරමින් විවිධාකාරයේ ඉගෙනුම් ශෛලීන් යොදා ගැනීම ද මෙයට හේතුවක් විය හැකිය.

**මාධ්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම:** අපගේ අධ්‍යාපනික ක්‍රියාකාරකම් බොහොමයක් පෙළ විස්තර සම්බන්ධයෙන් විචාරාත්මකව විමසා බැලීම වර්ධනය කිරීම කෙරෙහි යොමු වී ඇත. අවබෝධය සහ විචාරාත්මකව විමසා බැලීම වැඩිදියුණු කරන ඉතිහාසය, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි වැනි විෂයයන් තවමත් බහුලව පෙළ විශ්ලේෂණය මත පදනම් වේ. දශක කිහිපයකට පෙර කාලය දක්වා මානව ඉතිහාසයේ මූලික සන්නිවේදන ක්‍රමය ලෙස බහුලව පෙළ (text) භාවිත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මෙය දැක්විය හැකිය. බොහෝ ගුරුවරුන්ගේ ජීවිත කාලය තුළ, විප්ලවයක් වී ඇත. දෘශ්‍ය මාධ්‍ය, පෙළ අභිබවා ගොස් තොරතුරු, අදහස් සහ දෘෂ්ටිවාදයේ ප්‍රධාන සන්නිවේදකයා බවට පත්ව ඇත. දෘශ්‍ය ප්‍රචාරණයේ ආධිපත්‍ය සලකුණු වූ යුගයක, ප්‍රචාරණයන් පිටුපස ඇති අභිප්‍රායන් සහ ඊට්ටතු ගැන්වීම් සඳහා භාවිත කරන ක්‍රම විශ්ලේෂණය කිරීමේ හැකියාව තරුණ පුරවැසියන් තුළ තිබිය යුතු අත්‍යවශ්‍ය අංගයකි. පන්ති කාමරයට දෘශ්‍ය විශ්ලේෂණය හැකි විගසින් හඳුන්වා දීම අතිශයින් වැදගත් වේ.

[1] Raiyn, Jamal *The Role of Visual Learning in Improving Students' High-Order Thinking Skills*
[2] Mustafa Kaya, *The Impact of Visual Literacy Awareness Education on Verbal and Writing Skills of Middle School Students*

**ඉතිහාසය අධ්‍යයනය කිරීමේ ක්‍රමවේද පිළිබඳ ගැඹුරු අවබෝධයක්:** ඉතිහාසය යනු අතීතයේ වූ දේ පිළිබඳ කතාවක් ඉගෙන ගැනීම නොව, ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනය මත පදනම් වූ අඛණ්ඩ අර්ථකථන සහ විවාද ඇතුළත් ක්‍රියාවලියක් යන අදහසට සිසුන් ක්‍රමයෙන් හුරු කරවීමට මෙය අගනා අවස්ථාවකි. බොහෝ විට යම් දෙයක තේරුම පැහැදිලිව පවසන පෙළ ඇතුළත් මූලාශ්‍රවලට වඩා, දෘශ්‍ය රූප සාමාන්‍යයෙන් තේරුම් ගැනීමට අපහසු හා බහුඅර්ථ විය හැකිය. ඓතිහාසික සිතුවමක්, පෝස්ටරයක් හෝ කාටූනයක් පිළිබඳ විමසීමේදී, සිසුන් අනිවාර්යයෙන්ම විවිධ අර්ථකථනවලට පැමිණෙනු ඇත. ගුරුවරුන්ට යම් දෘශ්‍ය රූපයක් පිළිබඳ ඉදිරිපත් වන විවිධ මතයන් යොදා ගනිමින් සිසුන් අතර විවාදයක් ඇති කළ හැකිය - මෙමගින් ඉතිහාසඥයින් අර්ථකථන සම්බන්ධයෙන් එකඟ නොවන ආකාරය උදාහරණයක් ලෙස නිරූපණය කරයි. ලිඛිත පෙළ හැරුණු කොට, සිතුවම් සහ ඡායාරූපවල සිට මූර්ති, මැටි භාණ්ඩ, මෙවලම් සහ ආයුධ දක්වා බොහෝ ප්‍රාථමික මූලාශ්‍රවලට දෘශ්‍ය විශ්ලේෂණ කුසලතා අවශ්‍ය වේ. එබැවින් ඉතිහාසය ඉගෙන ගන්නා ශිෂ්‍යයකුගේ මෙවලම් කට්ටලයේ ප්‍රධාන අංගයක් ලෙස දෘශ්‍ය විශ්ලේෂණ කුසලතා දැක්විය හැකිය.

**සංවේදනය සහ සක්‍රියව සම්බන්ධ වීම වැඩිදියුණු කිරීම:** දෘශ්‍ය මූලාශ්‍ර මගින් අතීතයේදී යමක් අත්විඳීම කෙබඳුද යන්න පිළිබඳ ක්ෂණික අත්දැකීමක් දිය හැකි අතර, ඔවුන්ගේ සංවේදනය වැඩිදියුණු කිරීමට උපකාරී වේ. දෘශ්‍ය මූලාශ්‍ර, ඒවායේ ඇති ජීව ගුණය නිසා, බොහෝ විට චිත්තවේගී ප්‍රතිචාර (emotional response) ඇති කරයි. තම සිසුන් පාඩම සමග සක්‍රියව සම්බන්ධ කර ගැනීම සඳහා අරගල කරන ඕනෑම ඉතිහාස ගුරුවරයකු, පන්ති කාමරය තුළ එය අත්‍යවශ්‍ය උපක්‍රමයක් බව දනියි. පාඩම ආරම්භයේදී චිත්තවේගී ප්‍රතිචාරයක් නිර්මාණය කිරීම, සිසුන්ට තමන්ට හැඟෙන ආකාරය, රූපය එම හැඟීම ඇති කළේ කෙසේද යන්න සහ හැඩගස්වාගත්තේ කෙසේද යන්න මෙන්ම විවිධ සිසුන්ගේ එකිනෙකට වෙනස් ප්‍රතිචාර සන්සන්දනය කරන්නේ කෙසේද යන්න විශ්ලේෂණය කිරීම සඳහා සිසුන්ට මග පෙන්විය හැකි විශිෂ්ට ආරම්භක ලක්ෂ්‍යයකි.

**සිසුන්ගේ දෘශ්‍ය සන්නිවේදන කුසලතා වැඩිදියුණු කිරීම:** දෘශ්‍ය මාධ්‍ය සහ සමාජ මාධ්‍ය අපගේ සංස්කෘතික අවකාශය වැඩි වශයෙන් අත්පත් කර ගන්නා යුගයක, සිසුන් සිය දෘශ්‍ය සන්නිවේදන කුසලතා වැඩිදියුණු කර ගැනීම අත්‍යවශ්‍ය වේ. අනෙකුත් නිර්මාණකරුවන් ඵලදායී දෘශ්‍ය නිර්මාණය කරන ආකාරය විශ්ලේෂණය කිරීමට ඉගෙන ගැනීම, ඔවුන්ට තම සන්නිවේදන කුසලතා වැඩිදියුණු කර ගැනීමට උපකාරී වේ. නැගී එන තාක්ෂණික ආර්ථිකයේ බොහෝ වෘත්තීන් සඳහා එය අත්‍යවශ්‍ය මූලික කුසලතාවයකි.

## ඉතිහාසය අධ්‍යයනයට දෘශ්‍ය කුසලතා සම්බන්ධ වන්නේ කෙසේද?

ඉතිහාසය අධ්‍යයනය කිරීම සඳහා සිසුන් මූලික කුසලතා දෙකක් ප්‍රගුණ කළ යුතුය:
අතීත-ප්‍රාථමික මූලාශ්‍රවල අප සතුව ඇති ශේෂයන් විශ්ලේෂණය කරන්නේ කෙසේද?
ඉතිහාසඥයින් හෝ කලාකරුවන් විසින් අතීත-ද්විතීයික මූලාශ්‍ර පිළිබඳව සපයන අර්ථකථන විශ්ලේෂණය කරන්නේ කෙසේද?

මෙම මූලාශ්‍ර වර්ග දෙකටම දෘශ්‍ය විශ්ලේෂණ කුසලතා අවශ්‍ය විය හැකිය. උදාහරණයක් ලෙස, අප භාවිත කරන ඇතැම් ප්‍රාථමික මූලාශ්‍ර ලෙස සිතුවම්, ඡායාරූප සහ කාටූන් දැක්විය හැකිය. එසේ ම ඓතිහාසික චිත්‍රපට සහ රූපවාහිනී වැඩසටහන් තාක්ෂණික වශයෙන් ද්විතීයික මූලාශ්‍ර වන්නේ ඒවා අතීතය පිළිබඳ නිර්මාණකරුගේ දෘෂ්ටිකෝණය අපට ඒත්තු ගැන්වීමට උත්සාහ කරන බැවිනි. මෙම මාර්ගෝපදේශය ප්‍රාථමික මූලාශ්‍ර විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය දෘශ්‍ය කුසලතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත, නමුත් සිසුන් මෙම කාර්මික කුසලතා කිහිපයක් හුරු කරගෙන, ඔවුන් දකින දේ විශ්ලේෂණය කිරීමට පුරුදු වූ පසු, කාටූනයක් හෝ ඓතිහාසික චිත්‍රපටයක් වැනි ද්විතීයික මූලාශ්‍ර දෙසද විචාරාත්මකව බැලීමේ කුසලතාවන්ගෙන් ඔවුන් සන්නද්ධ වේ.

## ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යනයේ සාමාන්‍ය කුසලතා

සිසුන් හට දෘශ්‍ය කුසලතා ඉගැන්වීමේ ක්‍රියාවලිය සරල කිරීම සඳහා, අපි ඒවා ඉතිහාසය පිළිබඳ ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනය කිරීමේ පුළුල් පරාසයක පැතිරුණු කුසලතා මාලාවට ඇතුළත් කර ගැනීම වැදගත් වේ. ලිපියක්, රජයේ ලේඛනයක්, කතාවක්, ඡායාරූපයක් හෝ දේශපාලන කාටූනයක් ආදී, ඕනෑම ප්‍රාථමික මූලාශ්‍රයක් අධ්‍යයන කරන සෑමවිටම, අපි පහත දැක්වෙන මූලික කරුණු සොයාගත යුතුය:

**සම්භවය -** වස්තුව කුමක්ද සහ එම කාලයේ එහි කාර්යය කුමක්ද? එය නිර්මාණය කළේ කවුද? එය අප වෙත පැමිණියේ කෙසේද? සහ එහි යම් වෙනස් කිරීමක් හෝ විකෘති කිරීමක් කර තිබේද?

**සන්දර්භය -** මූලාශ්‍රයට අදාළව එම අවස්ථාවේ සිදුවන්නේ කුමක්ද? මූලාශ්‍රය මගින් සදහන් කළ හැකි ගැටලු සහ සිදුවීම් මොනවාද - සහ සෘජුවම සඳහන් කළ නොහැකි නමුත් මූලාශ්‍රය තේරුම් ගැනීමට තවමත් වැදගත් වන දේ මොනවාද?

**දෘෂ්ටිකෝණය -** රූපය තුළින් මතු වන නිර්මාණකරුගේ අදහස හැඩගැස්වීමට, ඔහුගේ ස්ත්‍රී පුරුෂ භාවය, සංස්කෘතික පසුබිම, සමාජ තත්ත්වය වැනි සාධක බලපායි. එම නිසා, නිර්මාණකරුට ඇති වූ හැගීම් හෝ ඔහු විශ්වාස කළ දේ පිළිබඳ විශ්වාසනීය අනුමානයක් කිරීමට නම් අපට ඔහු ජීවත්වූ කාලය සහ සමාජය පිළිබඳ අපට ඇති දැනුම භාවිත කළ යුතු වේ. මේ සඳහා අපට 'ඓතිහාසික සංවේදනය' අවශ්‍ය වේ.

**ප්‍රේක්ෂකයින් -** ඇතැම් විට මෙය ලිපියක් ලිවීම මෙන් පහසුය, නමුත් ඇතැම් විටක මෙයට වඩා වැඩි ආයාසයක් අවශ්‍ය වන අතර, දැනුවත් අනුමානයක් කළ යුතුය. මූලාශ්‍ර වර්ගය, නිර්මාණකරු, නිර්මාණයේ කාලය සහ දෘෂ්ටිකෝණය විශ්ලේෂණය කිරීම, අපේක්ෂිත ප්‍රේක්ෂකයින් කවුරුන් විය හැකිදැයි අනුමාන කිරීමට අපට උපකාරී වේ.

**අභිප්‍රාය -** මෙවලම් හෝ ආයුධ ආදිය දෘශ්‍ය රූපයක යොදා ගැනීමේ අභිප්‍රාය හඳුනා ගැනීම පහසුය, නමුත් කලාත්මක හෝ පෙළ මූලාශ්‍ර සමගසාපේක්ෂව බැලූ කළ, මෙය බොහෝ අපහසු වේ. මෙහිදීද අපි මූලාරම්භය, සන්දර්භය, දෘෂ්ටිකෝණය සහ ප්‍රේක්ෂකයින් පිළිබඳ අපි පිළිගෙන ඇති දේ භාවිත කරමින් දැනුවත් අනුමානයක් කළ යුතුය.

මේවා සිසුන්ට පුළුල් නිපුණත්වයක් තිබිය යුතු මූලික විශ්ලේෂණ කුසලතා වේ, එබැවින් අපි යෝජනා කරන්නේ, සෑම පාඩම් සැලැස්මකදීම, සිසුන් යන විශ්ලේෂණාත්මක ගමනේදී මෙම මූලික විශ්ලේෂණාත්මක මාතෘකා පාඨ වෙත ඔවුන්ගේ අවධානය යොමුකරවන ලෙසයි. එක් ක්‍රමයක් නම්, සෑම පාඩමකම මෙම අංග සඳහා සරල වගුවක් පුරවා ගැනීමට සිසුන්ට සැලැස්වීමයි. මෙමගින් පාඩම් වෙනස් වන විට පවා, විවිධ ආකාරයේ දෘශ්‍ය මූලාශ්‍ර ඉදිරිපත් කිරීම් සඳහා සිසුන්ට මූලික කුසලතා නැවත කිරීමට සහ ප්‍රගුණ කිරීමට ඉඩ සලසන අතර, කාලයත් සමග සිසුන්ගේ ප්‍රගතිය සංසන්දනය කිරීමට සහ මැන බැලීමට ගුරුවරුන්ට සරල මෙවලමක් සපයයි.

| | |
|---|---|
| **සම්භවය** | |
| **සන්දර්භය** | |
| **දෘෂ්ටිකෝණය** | |
| **ප්‍රේක්ෂකයින්** | |
| **අභිප්‍රාය** | |

මෙම වගුව පිරවීම සඳහා, සිසුන් නරඹමින් සිටින මූලාශ්‍රය අනුව ඔවුන්ට විවිධ කුසලතා අවශ්‍ය වේ. පෙළ සහිත මූලාශ්‍රයක් මගින් සිසුන්ට අනුප්‍රාසය, ප්‍රශ්නවාචී ප්‍රකාශන සහ ආඛ්‍යාන වැනි සාහිත්‍ය ශිල්පීය ක්‍රම පිළිබඳව හුරුපුරුදු වීමට අවශ්‍ය වේ. ඒ හා සමානව, දෘශ්‍ය රූප මූලාශ්‍රයකදී නරඹන්නා රූපයක් තේරුම් ගන්නා ආකාරය හැඩගැස්වීම සඳහා නිර්මාණකරුවන් විසින් භාවිත කරන ශිල්පීය ක්‍රම පිළිබඳව හුරුපුරුදු වීම අවශ්‍ය වේ. මෙම මාර්ගෝපදේශය දේශපාලන කාටූන්වලදී භාවිත කරන දෘශ්‍ය ශිල්පීය ක්‍රම කෙරෙහි අවධානය යොමු කරයි- එය ගුරුවරුන්ට පහසුවෙන් මාර්ගගතව ප්‍රවේශ විය හැකි සහ තම පාඩම්වලට ඇතුළත් කළ හැකි, විශේෂයෙන් නූතන ශ්‍රී ලංකා ඉතිහාසය පිළිබඳ පොදු දෘශ්‍ය මූලාශ්‍රයකි. මෙම මාර්ගෝපදේශය සමග සබැඳි එකතුවක් ද ඇත, එය ප්‍රයෝජනවත් සම්පතක් වනු ඇතැයි අපි බලාපොරොත්තු වන්නෙමු.

## දේශපාලන කාටූන් ඇසුරෙන් දෘශ්‍ය රූප විශ්ලේෂණය ඉගැන්වීම සඳහා පාඩම් සැලැස්මක් සකස් කිරීම

මෙහිදී පසුබිම් පර්යේෂණයක් කිරීම සහ එම කාටූන් අයිතම අයත් ප්‍රභේදයේ නිර්මාණකරුවන් භාවිත කරන සාම්ප්‍රදායික ශිල්පීය ක්‍රම මොනවාද යන්න තේරුම් ගැනීම ඉතා වැදගත් වේ. උදාහරණයක් ලෙස, ඔබ ඉතිහාසය හා සම්බන්ධ චිත්‍රයක් විශ්ලේෂණය කිරීමට සිසුන්ට උගන්වන්නේ නම්, චිත්‍ර ශිල්පීන් භාවිත කරන ශිල්පීය ක්‍රම ගැන සාකච්ඡා කළ යුතුය. දේශපාලන කාටූන් සම්බන්ධයෙන්, කාටූන් ශිල්පීන් භාවිත කරන මෙම මෙවලම් පිළිබඳව සිසුන් හුරුපුරුදු විය යුතුය:

1. විකට රූපය
2. සංකේතය
3. ලේබල් කිරීම (කාටූනය තුළ)
4. කථාව
5. ලේබල් කිරීම (කාටූනයේ රාමුවෙන් පිටත)

තවද, පහත සඳහන් සාහිත්‍ය උපාංග ද බහුල විය හැකිය:

1. උපමා
2. රූපක

ඉහත දැක්වෙන දෘ මොනවාද සහ දෘශ්‍ය රූපයක අර්ථය හැඩගැස්වීමට ඒවා භාවිත කරන්නේ කෙසේද යන්න තේරුම් ගැනීම සඳහා සිසුන්ට සහය වීමට ඔබට භාවිත කළ හැකි ආදර්ශ පාඩම් සැලසුම් දෙකක් පහත දැක්වේ.

## ආදර්ශය පාඩම් සැලසුම්

මෙම ආදර්ශ පාඩම් සැලසුම්වල අඩංගු වන්නේ:

1. පියවරෙන් පියවර සඳහන් කළ පාඩම් සැලැස්මක්
2. තෝරාගත් මූලාශ්‍ර
3. දෘශ්‍ය රූප විශ්ලේෂණ කුසලතා පුහුණු කිරීම සඳහා වන ප්‍රශ්න සහිත වැඩ පත්‍රිකා
4. ප්‍රාථමික මූලාශ්‍ර විශ්ලේෂණයේ මූලික කුසලතා කෙරෙහි අවධානය යොමු කරන සරල වගුවක්

පහත පාඩම් සැලැස්ම මූලාශ්‍ර A සහ B භාවිත කරයි. මෙම පාඩම ආරම්භක මට්ටමේ සිසුන් සඳහා වඩාත් සුදුසු පාඩමකි. එයට හේතු වනුයේ, සාපේක්ෂවගත් කල, මෙම කාටූන් යුගලයට සරල දෘශ්‍ය රූප සංරචනයක් ඇත, කාටූනයක ඇති මූලික සංරචක ඇතුළත් වේ, පුනරාවර්තනය වන මූලිකාංග ඇත, එමෙන්ම කාටූන් දෙක එකට තැබූ විට ඒවා සමකාලීන අදාළත්වයක් ඇති සරල ඓතිහාසික ප්‍රශ්න මතු කරයි.

මෙම පාඩම් සැලැස්ම සිසුන්ගේ කුසලතාවන්හි ක්‍රමානුකූල ප්‍රගතියක් ගොඩනගන, නැවත නැවත පුහුණු කිරීම් ඇතුළත් කාර්යය පෙළක් යෝජනා කරයි. පාඩමේ රිද්මය වන්නේ ගුරුවරයා ප්‍රධාන ලක්ෂණයක් පැහැදිලි කිරීම, කාටූනයේ මෙම ලක්ෂණය අධ්‍යයනය කරන ලෙස සිසුන්ගෙන් ඉල්ලා සිටීම, සහ සියලුම සිසුන් සාකච්ඡාව සමග සම්බන්ධ වන බව සහතික කර ගැනීම සඳහා කෙටි සාකච්ඡාවකට නැවත යොමුවීමයි. මෙම අවස්ථාවේදී, සිසුන් කාර්ය පත්‍රයේ අදාළ ප්‍රශ්නයට පිළිතුරු දීමට පෙර, යුගල කිරීම සහ අදහස් හුවමාරු කර ගැනීමේ (pair-share) ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම එලදායී වනු ඇත. අවසාන වශයෙන්, සිසුන් ප්‍රශ්නයකට පිළිතුරු ලිවීමේදී, සාකච්ඡා කිරීමෙන් ගත් තොරතුරු සංස්ලේෂණය කිරීමට එය උපකාරී වේ.

පහත දැක්වෙන ඒකකයේදී, 1956 ජනවාරි සිට අප්‍රේල් තෙක් ප්‍රකාශයට පත් වූ දේශපාලන කාටූන් භාවිත කරන අතර, ඒවා තෝරා තෝරා ගෙන ඇත්තේ එම වසරේ පැවති ඓතිහාසික මැතිවරණය කෙරෙහි අවධානය යොමු කිරීම අරමුණු කරගෙනය. ගුරුවරයකුට මෙම පාඩම තම විෂය මාලාවට ඇතුළත් කිරීමට අවශ්‍ය නම්, කදිම අවස්ථාව වන්නේ ජාතික අධ්‍යාපන ආයතනය (NIE) විසින් නියම කළ 9 ශ්‍රේණියේ හෝ 11 ශ්‍රේණියේ විෂය නිර්දේශයේ මෙම ඓතිහාසික කථාංගය දක්නට ලැබීමයි. එම ශ්‍රේණි දෙකෙහිම ඉතිහාස පෙළ පොත්වල, 1956 මැතිවරණ, දේශපාලන සන්දර්භය මෙහෙයවන ප්‍රධාන කරුණු සහ පසුකාලීන රජයන් විසින් පනවන ලද ප්‍රතිපත්ති පිළිබඳ කෙටි සාකච්ඡාවක් ඇත. තෝරාගත් කාටූන් මෙවැනි ගැටලු පෙළක් පිළිබඳව පසුවිමසුමක් කරන අතර, දෘශ්‍ය රූප විශ්ලේෂණ කුසලතා වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරන ආකර්ෂණීය පාඩමක් නිර්මාණය කිරීමට එය භාවිත කළ හැකිය.

මෙම කාටූන් සහිත මූලාශ්‍ර එකතුවට Historiana වෙබ් අඩවිය මගින් ප්‍රවේශ විය හැකිය:
https://historiana.eu/partners/histories-that-connect-sri-lanka

සටහන: මෙම මැතිවරණයේ විවාදාත්මක ස්වභාවය සහ එය ජනවාර්ගික ගැටුම්වලදී ඇති කළ බලපෑම සැලකිල්ලට ගනිමින්, එවැනි සංවාදයක් පවත්වා ගෙන යාමට අවශ්‍ය විශ්වාසය සහ කුසලතාව ගුරුවරයාට සපයන අයුරින් මෙම ඒකකය සැලසුම් කර ඇත.

## පාඩම් සැලැස්ම I : කොටස A (කාලය - පැය 1යි)

මෙම පාඩමේදී ගුරුවරයා විසින් සිසුන්ට කාටූන්වල රූප සංරචනය, විකට රූප හා සංකේත භාවිතය සහ කාටූන් ශිල්පියකු මේ සියල්ල භාවිතයෙන් අප කාටූනය දකින අයුරු හැඩගස්වන ආකාරය යන සරල සංකල්ප තුනක් හඳුන්වා දෙනු ඇත.

### කුසලතා අංක 1: රූප සංරචනය (Composition) අවබෝධ කර ගැනීම

**පියවර 1: විශ්ලේෂණය සඳහා සූදානම් වීම**

පළමු වන ප්‍රශ්නයට තනිවම පිළිතුරු දීමට සිසුන්ට පවරන්න. මූලාශ්‍රයක ශීර්ෂ පාඨය :ජ්වඑසදබ* මගින් සපයන මූලික විස්තර සටහන් කර ගැනීමට සිසුන් පුරුදු කිරීම වැදගත් වේ.

**පියවර 2: සංරචක වෙන වෙනම සටහන් කිරීම**

රූපයට ඉහළින් හෝ පහළින් ඇති ශීර්ෂ පාඨ කෙරෙහි අවධානය යොමු නොකර, මූලාශ්‍ර ˚ ප්‍රවේශමෙන් අධ්‍යයනය කිරීමට සිසුන්ට පවසන්න. වැඩ පත්‍රිකාවේ දෙවන ප්‍රශ්නය සඳහා කාටූනයේ ඇති චරිත සහ වස්තු ලැයිස්තුවක් සෑදීමට ඔවුන්ට පවරන්න. මෙම පියවර සිසුන්ට තොරතුරු කෙරෙහි ප්‍රවේශමෙන් අවධානය යොමු කිරීමට පුහුණු කරන අතර, අර්ථය නිර්මාණය වන්නේ මෙම වස්තු එකට එකතු වූ විටය යන අදහස පිළිබඳ අවධානය යොමු කරයි.

**පියවර 3: රූප සංරචනය අවබෝධ කිරීම**

දෘශ්‍ය රූපයේ මැද අලියකු පිට සිටින පුද්ගලයා පිහිටුවා ඇති ආකාරය ගැන පෙන්වා දෙන්න. මෙමගින් කුමන අදහසක් මතු වන්නේ දැයි සිසුන්ගෙන් විමසන්න, මෙම රූපය කාටූනයේ අවධානය යොමුවන මූලික තැන බවට පිළිතුරු සිසුන්ගෙන්ම ගන්න. ඉහත සඳහන් කළ අලියකු පිට ගමන් කරන රූපයේ පිහිටීම, පහළ මායිමේ ඇති රූපවල හිස් සමග සංසන්දනය කිරීමට සිසුන්ට පවසන්න. මෙම රූපවල වැදගත්කම පිළිබඳව එයින් ඇඟවෙන්නේ කුමක්ද? කාටූනයක අවකාශ සංවිධානය යනු කලාකරුවා කලාකෘතියේ අර්ථය පැහැදිලි කිරීම සඳහා භාවිත කරන සරල හා බලවත් මෙවලමක් බව සාකච්ඡා කරන්න.

## කුසලතා අංක 2: විකට රූප අවබෝධ කර ගැනීම

**පියවර 1: විකට රූප හඳුනා ගැනීම**

විකට රූපයක් යනු කුමක්දැයි ශිෂ්‍යයකුට පැහැදිලි කරන්න (සපයා ඇති අර්ථ දැක්වීම් භාවිත කරමින්). අලියකු පිට නැගී සිටින පුද්ගලයාගේ රූපය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ රූපයක් සමග සංසන්දනය කිරීමට සිසුන්ට පවරන්න. ඡායාරූපය සමග සැසඳීමේදී, බණ්ඩාරනායක මහතාගේ පෙනුම අතිශයෝක්තියක් වන අයුරින් නිර්මාණය කර ඇති කාටූනයේ ලක්ෂණ ලැයිස්තුගත කිරීමට සිසුන්ට පවසන්න. මෙමගින් චරිතය හඳුනාගත හැකි අයුරු සහ එය හාස්‍යජනක වන අයුරු පන්තියේ සැවොම එක්ව සාකච්ඡා කරන්න. රූපය විනෝදකාමී වුවද, එය චරිතය හඳුනා ගැනීමට උපකාරී වන්නේ කෙසේදැයි කෙටි පැහැදිලි කිරීමක් ලිවීමට සිසුන්ට පවසන්න.

**පියවර 2: රූපයක සන්දර්භය**

මෙම අවස්ථාවේදී, සිසුන් මඳක් සිතා බැලීමට උත්සාහ කරවන්න. කාටූනය ප්‍රකාශයට පත් කරන ලද්දේ කුමන වසරේද? එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක සහ 1956 වර්ෂය ගැන ඔවුන් දන්නේ මොනවාද? 4 වන ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට සිසුන්ට පවරන්න.

විකට රූප ඇතුළත් කාටූන් බොහෝ විට පුද්ගලයකුගේ හෝ කණ්ඩායමකගේ සුවිශේෂිත ලක්ෂණ හෝ ගුණාංග අතිශයෝක්තියට ලක් කරමින්, ඔවුන් හඳුනාගත හැකි වන පරිදි සහ බොහෝ විට හාස්‍යජනක නිරූපණයක් ලෙස නිර්මාණය කරයි. මේවාට මුහුණේ ලක්ෂණ, ශරීර ප්‍රමාණයන් හෝ ඉරියව් වැනි ශාරීරික ගුණාංග ඇතුළත් විය හැකිය. විකට රූපයක් සාර්ථක වීමට නම්, එය කාගේදැයි හඳුනාගත හැකි විය යුතුය. පුද්ගලයකු හෝ කණ්ඩායමක් නියෝජනය කරන ප්‍රධාන ලක්ෂණ ඔබ හඳුනාගත් පසු, විවිධ කලාකරුවන් විසින් පවා එම කාලපරිච්ඡේදයේ කාටූන් මගින් එය නිර්මාණය කර ඇති අයුරු සමාන වන බව ඔබට පෙනෙනු ඇත. මෙයින් අදහස් වන්නේ කාලයත් සමග සෑම සිසුවකුටම එම යුගයේ විකට චිත්‍රවලට හුරුපුරුදු වීමේ හැකියාවක් වැඩිදියුණු කළ හැකි බවයි. ඒ සමගම මෙම අතිශයෝක්ති නිසා කාටූන්කරුවන්ට, තමා විකට රූපයට අඳින පුද්ගලයන් ගැන නොදන්නා ප්‍රේක්ෂකයන්ට පවා සංකීර්ණ අදහස් හෝ විවේචන ඉක්මනින් සහ ඵලදායී ලෙස ප්‍රකාශ කිරීමට ඉඩ සලසයි. විකට රූප මගින් කාටූන් ශිල්පීන්ට දේශපාලන චරිත, ප්‍රසිද්ධ පුද්ගලයින් හෝ සමාජ කණ්ඩායම් ඔවුන්ගේ අඩුපාඩු, ඔවුන්ගේ පෞරුෂයන්ගේ මතභේදාත්මක පැති හෝ ඔවුන්ගේ විෂයයන්ගේ හැසිරීම් හෝ දෘෂ්ටිවාදයන්හි ප්‍රතිවිරෝධතා විශාලනය කිරීමෙන් විවේචනයට, විනෝදයට හෝ විකෘති නිරූපණයකට ලක් කිරීමට ඉඩ සලසයි.

## කුසලතා අංක 3: සංකේත අවබෝධ කර ගැනීම

මෙම අදියරට පැමිණෙන විට සිසුන් මූලාශ්‍රයේ මූලික සංරචක සහ සන්දර්භය හඳුනා ගෙන ඇත. මෙම පාඩමෙන් කරන්නේ, කාටූන් ශිල්පියා මූලාශ්‍රය පිළිබඳ යම් පණිවිඩයක් දෙන ආකාරය ගවේෂණය කිරීමයි.

**පියවර 1:** බණ්ඩාරනායක මහතාගේ විකට රූපයේ ඔහු ඇඳ සිටින්නේ කුමක්ද සහ ඔහු කරන්නේ කුමක්ද යන්න හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න. අලියකු පිට නැගීම සහ මුල්-ඇඳුම ඇඳ සිටීම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න සාකච්ඡා කරන්න. සැමරීම, පෙරහැර, උත්කර්ෂවත් බව සහ ජයග්‍රහණය යන ඒවා සිසුන්ගේ පිළිතුරු වනු ඇත. සංකේතයක් යනු කුමක්ද (සපයා ඇති අර්ථ දැක්වීම් භාවිත කරමින්) පැහැදිලි කර උඩරට ඇඳුම සහ අලියා ඔවුන් යෝජනා කළ පිළිතුරට අදාළ සංකේතයක් වන්නේ කෙසේදැයි සිසුන්ට පැහැදිලි කරන්න. මෙම අදියරේදී, සාහිත්‍ය කතුවරයකු මෙන්ම, කාටූන් ශිල්පියකු ද තමාගේ රචනාත්මක විචාරය සපයන කලාකරුවකු ලෙස සිතීමට සහ කාටූන් ශිල්පියා ප්‍රේක්ෂකයින්ට යෝජනා කරන්නේ කුමක්දැයි විමසීමට සිසුන් පුරුදු කිරීම වැදගත් වේ.

**පියවර 2:** මෙම සංකේතය මගින් බණ්ඩාරනායක මහතා සහ මැතිවරණය පිළිබඳව කාටූන් ශිල්පියා යෝජනා කරන්නේ කුමක්දැයි පැහැදිලි කරමින් සිසුන් 5 වන ප්‍රශ්නයට පිළිතුරු දිය යුතුය. 'සෑම කාටූනයක් පිටුපසම, තම අදහස් සහ පක්ෂග්‍රාහීත්වයන් ඇති නිර්මාණකරුවකු සිටින අතර, ඔහු සිය රූපය මගින් ප්‍රේක්ෂකයන්ට බලපෑම් කිරීමට උත්සාහ කරයි' යන අදහස සිසුන්ට අවධාරණය කරන්න.

**පියවර 3:** සංකේත විමසා බැලීමට සහ ඒවා නිරූපණය කරන අර්ථයට අභියෝග කිරීමට සිසුන් යොමු කිරීම වැදගත් වේ. ඔටුන්න, උඩරට ඇඳුම සහ අලියා යන ඒවායෙන් අදහස් කරන්නේ කුමක්දැයි සිතා බැලීමට සිසුන් යොමු කරන්න, 'රජකම' සංකේතවත් කරන බවට පිළිතුරු සිසුන්ගෙන්ම ගන්න. ජනතා ඡන්දයෙන් තේරී පත් වන අගමැතිවරයකු සහ උරුමයකින් පත් වන රජෙකු අතර වෙනස්කම් හා සමානත්වයන් පිළිබඳව සාකච්ඡා කරන්න. ජනතා ඡන්දයෙන් තේරී පත් වූ නිලධාරීන් දෙස, රජුන් දෙස බලන රාජකීයත්වයේ කාචයෙන් බලන්නේ නම් ඇතිවිය හැකි ගැටලු මොනවාදැයි සාකච්ඡා කරන්න.

**සංකේත** යනු සංකීර්ණ අදහස් සහ අමූර්ත (abstract) සංකල්ප ඉතා ඉක්මනින් සහ පහසුවෙන් හඳුනාගත හැකි ආකාරයෙන් නිරූපණය කරන දෘශ්‍ය අංගයන්ය. බොහෝ විට ඇස් පිනවන, හාස්‍යජනක හෝ මතභේදාත්මක වන නිසා ඒවා නරඹන්නාගේ අවධානය ඉතා ඉක්මනින් ආකර්ෂණය කර ගන්නා අතර, රූපය ලෙස වඩාත් සමීපව බැලීමට ඔවුන්ව පොලඹව ගනියි. සංකේත බොහෝ විට භාවිත කරනුයේ සංවේදී අදහස් හෝ ගැටලුවක් පිළිබඳව විචිත්‍ර ලෙස ඉදිරිපත් කිරීමෙන් නරඹන්නා තුළ ප්‍රබල චිත්තවේගී ප්‍රතිචාරයක් ඇති කිරීමට ය. විශේෂයෙන් සංකේත එකිනෙක සම්බන්ධ වන විට ඒවා බහු මට්ටම්වලින් ක්‍රියාත්මක විය හැකිය, (නිදසුනක් ලෙස, සිංහයකුගේ පෙනුම ප්‍රබල දේශප්‍රේමී හැඟීමක් ඇති කළ හැකි නමුත්, කැඩපතක් ඉදිරිපිට තැබූ විට එය නරඹන්නාට දේශප්‍රේමය පිළිබඳ නැවත සිතා බලන්න ආරාධනා කරයි.) එබැවින් සංකේතයක් වටා ඇති අනෙකුත් වස්තූන් සහ සංකේත සම්බන්ධයෙන් ප්‍රවේශමෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ. එසේ අවධානය යොමු කළ යුතු සංකේත බොහෝ වර්ගවලින් සමන්විත විය හැකිය:

**ජාතික සංකේත:** ජාතික කොඩි, ලාංඡන හෝ මංසලකුණු බොහෝ විට රටවල් හෝ ජාතීන් නියෝජනය කිරීමට භාවිත කරයි. උදාහරණයක් ලෙස, දේශපාලන කාටූනයක ඇති ශ්‍රී ලංකා ධජය දේශප්‍රේමය හෝ ජාතික අනන්‍යතාවය සංකේතවත් කළ හැකිය.

**දේශපාලන සංකේත:** නිශ්චිත දේශපාලන මතවාද, පක්ෂ හෝ ව්‍යාපාර සමග සම්බන්ධ සංකේතවලට දේශපාලන පණිවිඩ ප්‍රකාශ කළ හැකිය. නිදසුනක් වශයෙන්, .සිංහයකු සිංහල ජනතාව නියෝජනය කිරීමේ දේශපාලන සංකේතයක් වශයෙන් පෙනෙන්නට තිබේ.

**ඓතිහාසික සංකේත:** ඓතිහාසික වැදගත්කමක් ඇති සංකේත, අතීත සිදුවීම් හෝ මතවාද ඉස්මතු කිරීමට භාවිත කළ හැකිය. උදාහරණයක් ලෙස, සිංහාසනයක් හෝ ඔටුන්නක් රජකම නියෝජනය කළ හැකිය.

**සංස්කෘතික සංකේත:** සංස්කෘතික සම්ප්‍රදායන්, සාම්ප්‍රදායික සංකල්ප (stereotypes) හෝ සළකුණුවලින් (icons) ගත් සංකේතවලට සංස්කෘතික විවරණ හෝ විවේචන ප්‍රකාශ කළ හැකිය. මෙම සංකේතවලට ආගමික රූප, සංස්කෘතික කෞතුක වස්තු හෝ ඇතැම් ජනවාර්ගික කණ්ඩායම් සමග සම්බන්ධ සාම්ප්‍රදායික සංකල්ප ඇතුළත් විය හැකිය. උදාහරණයක් ලෙස, චරිතයක ඇඳුමෙන් එම පුද්ගලයා සම්බන්ධ වන්නේ කුමන ආකාරයේ සංස්කෘතියක් සමගද යන්න අපට පැවසිය හැකිය.

## කාර්යය 3: ශීර්ෂ පාඨ (caption) අධ්‍යයනය කිරීම

**පියවර 1:** ශීර්ෂ පාඨයක් නොමැතිව කාටූනයේ තේරුම පැහැදිලිද යන්න සාකච්ඡා කිරීමට සිසුන්ගෙන් ඉල්ලා සිටින්න: කාටූනය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක වර්ණනා කරනවා නැත්නම් විවේචනය කරනවාද? තර්කයේ දෙපසටම ප්‍රතිචාර එකතු කරන්න (වර්ණනා කිරීම: ඔහු අලියකු පිට ජයග්‍රාහී රාජකීය ඇඳුමින් සැරසී සිටින බව පෙන්වයි. විවේචනය කිරීම: සාමාන්‍ය ජනතාව බණ්ඩාරනායකට පහළින් කෙළවරේ සිටින අතර ඔහු රජෙකු මෙන් සැරසී සිටින බව පෙන්වයි). කාටූනයක් දෙගිඩියාවෙන් යුක්තය යන අදහස අවධාරණය කරන්න. රූපයක තේරුම නිසැකවම පැවසීම දුෂ්කරය. 6 වන ප්‍රශ්නයට පිළිතුරු දීමට සිසුන්ගෙන් ඉල්ලා සිටින්න.


**පියවර 2:** කාටූනයකට විවිධ අර්ථයන් තිබිය හැකි බවට පෙර කළ සාකච්ඡාව පදනම් කරගෙන, කාටූන් ශිල්පීන් අර්ථය පාලනය කිරීම සඳහා කාටූනයකින් පිටත සහ ඒ අසල ශීර්ෂ පාඨ එකතු කරන ආකාරය පැහැදිලි කරන්න - පාඨකයා කාටූන් ශිල්පියාට අවශ්‍ය ආකාරයට කාටූනය දෙස බලන බවට වග බලා ගැනීමට එසේ කරයි. රූපයට ඉහළින් සහ පහළින් ඇති ශීර්ෂ පාඨ දෙකම කියවීමට සිසුන්ගෙන් ඉල්ලා සිටින්න. ශීර්ෂ පාඨ මගින් අදහස් කරන්නේ කුමක්දැයි ඔවුන්ගෙන් විමසන්න. කාටූන් ශිල්පියා පැහැදිලිවම ජයග්‍රහණය සමරන බව ඔවුන් කියනු ඇත. මෙම කාටූනයේ ශීර්ෂ පාඨය පාඨකයාගේ අවධානය යොමු කිරීමට අදහස් කරන

## විකල්ප ක්‍රියාකාරකම

අවසානයේදී ගුරුවරයාට, පහත දැක්වෙන ආකාරයේ වගුවක් සිසුන් සමග එක්ව පුරවා ගැනීම හැකියාව ඇත. ගුරුවරුන් වෙනත් ඒකකවලද ප්‍රාථමික මූලාශ්‍ර විශ්ලේෂණය පුහුණු කරන්නේ නම්, මෙම දෘශ්‍ය කුසලතා පුළුල් පරාසයක පැතිරුණු මූලික ඉතිහාස විශ්ලේෂණ කුසලතා සමග සම්බන්ධ කිරීමට මෙය උපකාරී වේ.

ඒමෙන්ම මෙම ක්‍රමවත් විශ්ලේෂණය මගින්, ප්‍රාථමික මූලාශ්‍රය පිළිබඳව විශාල ප්‍රමාණයක් තොරතුරු හෝ සාධකමය තර්ක අනාවරණය වී ඇති බව සිසුන්ට වටහා ගැනීමටත්, ඔවුන්ට පසෙකට වී සිට නිරීක්ෂණය කරමින් සවිස්තරාත්මකව ඇගයීමටත් මෙය උපකාරී වේ.

| | |
|---|---|
| **සම්භවය** | |
| **සන්දර්භය** | |
| **දෘෂ්ටිකෝණය** | |
| **ප්‍රේක්ෂකයින්** | |
| **අභිප්‍රාය** | |




**මූලාශ්‍රය A**

1956 අප්‍රේල් 12 වන දින දිනමිණ පුවත්පතේ පළ වූ කාටූනයක්.

# ක්‍රියාකාරකම් පත්‍රිකාව
# පාඩම I : කොටස A

1) මූලාශ්‍රය ප්‍රකාශයට පත් කළේ කවදාද සහ කුමන පුවත්පතේද?

............................................................................................................................................................
............................................................................................................................................................
............................................................................................................................................................
............................................................................................................................................................

2) කාටූනයේ ඇති සියලුම චරිත සහ වස්තූන් ලැයිස්තුවක් සාදන්න.

............................................................................................................................................................
............................................................................................................................................................
............................................................................................................................................................
............................................................................................................................................................

3) කාටූනයේ මැද චරිතය පිහිටවීම සහ පහළ මායිම දිගේ චරිත පිහිටවීමෙන් ඔවුන් අතර ඇති සම්බන්ධතාවය ගැන අදහස් කරන්නේ කුමක්ද? කාටූන් ශිල්පියා කියන්නට උත්සාහ කරන්නේ කුමක්ද?

............................................................................................................................................................
............................................................................................................................................................
............................................................................................................................................................
............................................................................................................................................................

4) ඔබේ පෙළ පොතෙහි ඇති එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ පින්තූරයක් සමග ඉහත රූපය සසඳන්න. ඡායාරූපයේ ඇති ලක්ෂණ අතුරින් කාටූනයේ අතිශයෝක්තියට නංවා ඇති ලක්ෂණ මොනවාද?

............................................................................................................................................................
............................................................................................................................................................
............................................................................................................................................................
............................................................................................................................................................

5) මෙම මූලාශ්‍රය තේරුම් ගැනීම සඳහා 1956 වසරේ සන්දර්භය පිළිබඳව අප දැනගත යුතු කරුණු මොනවාද?

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

6) බණ්ඩාරනායක මහතා සහ 1956 මැතිවරණය පිළිබඳව කාටූන් ශිල්පියා නරඹන්නාට ප්‍රකාශ කරන්නේ කුමක්ද?

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

7) ජනතා ඡන්දයෙන් තේරී පත් වූ නිලධාරියෙක් වන බණ්ඩාරනායක මහතා රජෙකුගේ ඇඳුමින් සැරසීම නිවැරදි යැයි ඔබ සිතනවාද? ඔබේ අදහස පැහැදිලි කරන්න.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

8) ශීර්ෂ පාඨය කියවීමෙන් තොරව, කාටූනය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක වර්ණනා කරනවා ද, විවේචනය කරනවා ද යන්න පිළිබඳව ඔබ සිතන්නේ කුමක්ද? ඔහු පැළඳ සිටින ඇඳුම, ඔහුගේ රූපය රාමුවේ පිහිටුවා ඇති ආකාරය සහ අනෙක් පුද්ගලයින් රාමුවේ පිහිටුවා ඇති ආකාරය සැලකිල්ලට ගන්න.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

9) ශීර්ෂ පාඨයෙන් ප්‍රකාශ කරන දෙය සාරාංශ කරන්න. කාටූන් ශිල්පියා අපට මෙම මූලාශ්‍රය තේරුම් ගැනීමට යෝජනා කරන ආකාරය එයින් දැක්වෙන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

............................................................................................................................................

# පාඩම් සැලැස්ම I : කොටස B
# (කාලය - පැය 1යි)

මෙම පාඩම පෙර පාඩම මත පදනම්ව ගොඩනගන ලද්දකි. එය පෙර අවස්ථාවේ හැදෑරූ දෘශ්‍ය විශ්ලේෂණ කුසලතා නැවත සමාලෝචනය කරන අතර "රූපක" (metaphor) යන සංකල්පය ගවේෂණය කරයි. මෙම පාඩම 'ස්වභාෂා ව්‍යාපාරය' පිළිබඳව පෙළ පොතේ දැක්වෙන අදහස් අභියෝගයට ලක් කිරීමට උපකාරී වේ. මෙම ව්‍යාපාරය සීමාසහිත වූයේ ඇයි ද යන්න මෙන්ම විෂය නිර්දේශයේ දැක්වී නොමැති දෘෂ්ටිකෝණයන් පිළිබඳව ගුරුවරුන්ට මෘදු ලෙස ප්‍රශ්න කිරීමට මෙය අවස්ථාවක් සලසයි.

අවසාන වශයෙන්, ගුරුවරුන්ට කාටූන් දෙකක් එක්ව සලකා බලමින්, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ මැතිවරණ ජයග්‍රහණය පිළිබඳව පැවති විවිධ මතයන් සංසන්දනය කිරීමට සිසුන්ට උපදෙස් දිය හැකිය. මෙම කාටූන් දෙකම එකම දිනයේදී විවිධ පුවත්පත් දෙකක පළවී ඇති අතර, ප්‍රතිචාරවල පැහැදිලි වෙනසක් පෙන්නුම් කරයි. මෙය විමර්ශනය සඳහා බහුවිධ මාර්ග විවෘත කරයි. එක් මට්ටමකදී, මෙම පාඩමෙන් අවධාරණය කළ හැක්කේ, නිශ්චිත විෂය නිර්දේශයෙන් ඔබ්බට ඉතිහාසය පිළිබඳව විවිධ දෘෂ්ටිකෝණ පැවති බව සහ එවැනි විවිධ දෘෂ්ටිකෝණ පිළිබඳව සලකා බැලීමට දේශපාලන කාටූන් අපට සජීවී මාර්ගයක් සපයන ආකාරයයි. උපදේශකයන්ට සාකච්ඡාවක් ආරම්භ කරමින්, දේශීය සංස්කෘතිය නූතන දේශපාලන ගැටලු සඳහා විසඳුම් සපයනවාදැයි සිසුන් සිතන ආකාරය විමසිය හැකිය. මෙහිදී සිසුන්ට නිශ්චිත දෘෂ්ටිකෝණයකින් බැලීමට නියම කිරීම නොව, කාටූන් මගින් මතු කරන ප්‍රශ්න පිළිබඳව සිතා බැලීමට ඔවුන්ව දිරිමත් කිරීම වඩාත් වැදගත් වේ.

## කාර්යය 1: විකට රූප සහ රූප සංරචනය හඳුනා ගැනීමේ කුසලතා තහවුරු කරගැනීම

### පියවර 1: විශ්ලේෂණය සඳහා සූදානම් වීම

1 වන ප්‍රශ්නයට තනිවම පිළිතුරු දීමට සිසුන්ට පවරන්න. ශීර්ෂ පාඨ මගින් සපයනු ලබන මූලික තොරතුරු සටහන් කර ගැනීමට සිසුන් පුරුදු වීම වැදගත් බැවින්, මෙය නැවත නැවත සකිරීමට සැලැස්වීම වැදගත්ය.

### පියවර 2: වෙන වෙනම සංරචක සටහන් කිරීම

රූපයෙහි ඉහළ සහ පහළ කොටස්වල අක්ෂරික තොරතුරු (ශීර්ෂ පාඨ) නොසලකා හැර මූලාශ්‍ර ඊ ප්‍රවේශමෙන් අධ්‍යයනය කිරීමට සිසුන්ට පවරන්න. වැඩ පත්‍රිකාවේ 2 වන ප්‍රශ්නය සඳහා කාටූනයේ ඇති චරිත සහ වස්තූන් ලැයිස්තුවක් සෑදීමට ඔවුන්ගෙන් ඉල්ලා සිටින්න.

### පියවර 3: විකට රූපයක් හඳුනා ගැනීම

එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක හඳුනා ගැනීමට සිසුන් යොමු කරන්න. ඉන් පසුව ඔවුන්ට එම චරිතය හඳුනා ගැනීමට හැකි වූ විශේෂ ලක්ෂණ මොනවාදැයි විමසන්න. සාකච්ඡාවෙන් පසු, සිසුන්ට 3 වන ප්‍රශ්නයට පිළිතුරු දිය හැකිය.

### පියවර 4: රූප සංරචනය අවබෝධ කර ගැනීම

රූප සංරචනය කෙරෙහි සිසුන්ගේ අවධානය යොමු කරන්න. මූලික කාර්යය නම් සිසුන්ට රූපය විස්තර කරමින්, චරිතවල පිහිටීම් සහ විශේෂ තොරතුරු අවධානයට ගැනීමට සිසුන් පුරුදු කිරීමයි. රූපය මධ්‍යයේ ඇති චරිතය කවුද? සිසුන් ලේබලය කියවා ඔබට පවසනු ඇත. පිළිතුර පිළිගෙන ඉදිරියට යන්න, ඊළඟට අපි ලේබල් කෙරෙහි ගැඹුරින් අවධානය යොමු කරන්නෙමු.

රූපයේ මධ්‍යයේ සිටින්නේ කවුද? ඒ ලංකාවේ තත්ත්වය කියාපාන රෝගී කාන්තාවකි. පෙර පාඩමේදී රූප සංරචනය පිළිබඳ ඔවුන් ඉගෙනගත් දේ නැවත සිහිපත් කර කිරීමට සිසුන් යොමු කරන්න - කාන්තාව රූපයේ මධ්‍යයේ තැබීමෙන් කාටූන් ශිල්පියා අදහස් කරන්නේ කුමක්ද? උදාහරණයක් ලෙස, මෙම කාටූන ශිල්පියා  එස්.ඩබ්ලිව්. ආර්.ඩී. බණ්ඩාරනායක කෙරෙහිට වඩා රට කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්නේද?

## කාර්යය 2: ලේබල්, ශීර්ෂ පාඨ කියවීම සහ රූපකයක් අවබෝධ කර ගැනීම

**පියවර 1:** සිසුන්ට රූපය තුළ ඇති පෙළ (ලේබල් සහ ශීර්ෂ පාඨ) පිළිබඳ අවධානය යොමු කිරීමට පවසන්න. කාටූන් ශිල්පියා තම පණිවිඩය වඩාත් පැහැදිලිව ප්‍රකාශ කිරීම සඳහා රූපය තුළ සහ පිටත පෙළ සටහන් භාවිත කරන ආකාරය ඔවුන්ට සිහිපත් කරන්න. ‘Mother Lanka/ All manner of complications’ යන ලේබලයෙන් ආරම්භ කරන්න. කාටූන් ශිල්පියා රූපය කියවිය යුතු ආකාරය අපට පැහැදිලි කිරීමට මෙම ශීර්ෂ පාඨය යොදාගත් අයුරු සාකච්ඡා කරන්න. ඉන්පසු සිසුන්ගේ අවධානය ‘SWRD Banda (Ayurveda)’ යන ලේබලය වෙත යොමු කරන්න - මෙම රූපය බණ්ඩාරනායක මහතා ආයුර්වේදය සමග සම්බන්ධ කරන ආකාරය සාකච්ඡා කරන්න. මෙම අවස්ථාවේදී ගුරුවරයා විසින් ස්වභාෂා ව්‍යාපාරයේ සන්දර්භය පැහැදිලි කළ යුතුය. එසේම බණ්ඩාරනායක මහතා ස්වදේශික අදහස් සහ ක්‍රමවේද මගින් රටේ ගැටලු සඳහා හොඳම විසඳුම් දෙන බවට අදහස ප්‍රවර්ධනය කළ ආකාරය පැහැදිලි කිරීමට සිදු වනු ඇත. මෙම අදහස 9 සහ 11 ශ්‍රේණි පෙළ පොත්වල ද ඉස්මතු කර ඇත.

**පියවර 2:** ඇඳ අසල ඇති කබඩ් එකෙහි ‘Western medicine’ යනුවෙන් ලියා ඇත්තේ ඇයිදැයි සිසුන්ගෙන් විමසන්න. ‘Mother Lanka’ හට ප්‍රතිකාර කිරීම සඳහා භාවිත නොකරන ක්‍රම පිළිබඳව එයින් ඇඟවෙන්නේ කුමක්ද? මෙය සිසුන්ට රූප සංරචනය නැවත සිහිපත් කරවිය හැකි අවස්ථාවකි - කාටූන් ශිල්පියා අදහස් කරන්නේ කුමක්ද යන්න තේරුම් ගැනීමට, ‘Ayurveda’ සහ ‘Western Medicine’ යන ලේබල් ස්ථානගත කර තිබෙන අයුරු අපට උපකාරී වන්නේ කෙසේද? 6 වන ප්‍රශ්නයට පිළිතුරු දීමට සිසුන්ට පවරන්න.

**පියවර 3:** සිසුන්ට රූපක පිළිබඳ සංකල්පය පැහැදිලි කරන්න. මෙම කාටූනයේ රූපකය වන්නේ: රට රෝගී කාන්තාවක් ලෙසත්, නව අගමැති ප්‍රතිකාර වර්ග දෙකක් අතරින් තේරීමක් කරන වෛද්‍යවරයෙක් ලෙසත් දැක්වීමය. මෙම කාටූනයේ නිර්මාණකරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ මැතිවරණ ජයග්‍රහණය සැමරීමට වැඩි උනන්දුවක් නොදක්වන බව පෙනෙන අතර නව රජයේ ප්‍රතිපත්ති  එලදායී වේද යන්න පිළිබඳ ප්‍රධාන ප්‍රශ්නයක් ඇසීම කෙරෙහි උනන්දුවක් දක්වන බව පෙනේ. වෛද්‍යවරයා රෝගියාගෙන් විමසීම සහ ඖෂධ මල්ලක් රැගෙන යාම වැනි රූපක සංරචක භාවිතය මගින් කාටූන් ශිල්පියා මෙම පණිවිඩය දෙන ආකාරය මනාව පෙන්නුම් කරයි. 7 වන ප්‍රශ්නයට පිළිතුරු දීමට සිසුන්ට පවරන්න.


**රූපකයක් යනු,** සාහිත්‍යමය අර්ථයෙන්ගත් කල, එකිනෙකට සමාන නොවන වස්තූන් දෙකක් සන්සන්දනය කරමින් එම වස්තු දෙකම හෝ එකක් පිළිබඳව වියුක්ත ගුණාංගයක් හෝ අදහසක් පවසන කථන රූපයකි. දේශපාලන කාටූන්වලදී, රූපක භාවිතය මගින් ශිල්පීන්ට සංකීර්ණ දේශපාලන ගැටලු එකම ආකර්ෂණීය රූපයකට සංක්ෂිප්ත කළ හැකිය. දේශපාලන කාටූන්වල රූපක බොහෝ විට පුළුල්, වියුක්ත දේශපාලන සංකල්ප හෝ ආයතන නිරූපණය කිරීම සඳහා බහු සංකේත භාවිත කරයි. (උදාහරණයක් වශයෙන්, රටක නායකත්වය මුහුණ දෙන අභියෝග ලෙස කුණාටු සහිත මුහුදක යාත්‍රා කරන නැවක් නිරූපණය කිරීම.) සංකේත මගින් විස්තර කරන සංකල්පය, සංකීර්ණ විස්තර ප්‍රකාශ කිරීමට කාටූන් සඳහා වැදගත් මෙවලමක් වන අතර, මෙම විස්තර තුළ ඇති අන්තර් ක්‍රියාකාරිත්වය සහ සමස්තයක් ලෙස රූපකයේ ඇති සංකල්පය කෙරෙහි සිසුන් අවධානය යොමු කිරීම වැදගත් වේ. (නිදසුනක් වශයෙන්, ජාතියක් නැවක් ලෙස නිරූපණය කිරීමේදී, ඉරා දැමූ රුවල් සහ හානියට පත් බඳකට වෙනස් අර්ථයක් දෙනු ඇත.) දේශපාලන කාටූන්වල ඇති ශක්තිමත් උපහාසාත්මක සම්ප්‍රදාය සැලකිල්ලට ගෙන, රූපක බොහෝ විට උපහාසාත්මක අලංකරණ මගින් තවදුරටත් වර්ණවත් කරනු ලැබේ.

**විකල්ප කාර්යය:** පහත දැක්වෙන වගුව පුරවන ලෙස සිසුන්ගෙන් ඉල්ලා සිටින්න. එසේ කිරීමෙන් ඔවුන් ඉගෙනගත් කුසලතා යෙදවීමටත්, ස්වාධීනව වැඩ කිරීමටත් අභියෝගයක් දෙයි. එමගින් ඕනෑම ප්‍රාථමික මූලාශ්‍ර අභ්‍යාසයකින් පසු භාවිත කළ හැකි සම්මත මෙවලමක්ද සපයන අතර, මූලික විශ්ලේෂණ කුසලතා පුහුණු කරවාගෙන සිසුන්ට තම දියුණුව අවබෝධ කර ගැනීමට ද දායක වේ.

## කාර්යය 4: කාටූන් සංසන්දනය කිරීම

**පියවර 1:** කාටූන් දෙකම පළ වූ දිනය සලකා බැලීමට සිසුන්ගෙන් ඉල්ලා සිටින්න. එම කාටූන් දෙකම එකම දිනයේ, නමුත් වෙනස් පුවත්පත් දෙකක පළ කර ඇති බව සලකා බලන්න. ගුරුවරුන් විකල්ප ක්‍රියාකාරකමේදී සපයා ඇති වගු පංති කාමරයේදී භාවිත කර තිබේ නම්, කාටූන් දෙක පිළිබඳ සිසුන් පැවසූ දේ සංසන්දනය කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න. එසේ නොවේ නම්, වැඩ පත්‍රිකාවේ ඇති සරල වගුවක් පුරවා ගැනීමෙන් සිසුන්ට තම විශ්ලේෂණය සවිස්තරවත් කළ හැකිය.

**පියවර 2:** කාටූන් දෙකේ අර්ථකථන අතර ඇති වෙනස්කම් සහ ඒවා නිරූපණය කිරීම සඳහා භාවිත කළ විවිධ ශිල්ප ක්‍රම පිළිබඳව සාකච්ඡා කරන්න. සිසුන් දැනටමත් විශ්ලේෂණය කළ කාටූන් දෙකක් සමග සංසන්දනය කිරීම ඔවුන් ඉගෙනගත් දේ තහවුරු කර ගැනීමට උපකාර වන ක්‍රමයකි. සිසුන්ට පෙළ පොත පරිශීලනය කිරීමට සහ මෙම කාටූන් දෙක දැකීම ඔවුන්ට එම කාල පරිච්ඡේදය වඩාත් ගැඹුරින් තේරුම් ගැනීමට මෙන්ම සිතින් මව ගැනීමට උපකාර වී ඇත්දැයි සලකා බැලීමට උපදෙස් දෙන්න. පසුව, 8 වන ප්‍රශ්නයට පිළිතුරු සපයන්න.




**මූලාශ්‍රය B**

1956 අප්‍රේල් 12 වන දින සිලෝන් ඔබ්සර්වර් හි ප්‍රකාශයට පත් කරන ලදී.

# ක්‍රියාකාරකම් පත්‍රිකාව
# පාඩම I : කොටස B

1) මෙම මූලාශ්‍රය ප්‍රකාශයට පත් කළේ කවදාද? කුමන පුවත්පතේද?

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

2) කාටූනයේ පෙන්වා ඇති සියලුම චරිත සහ වස්තූන් ලැයිස්තුවක් සකස් කරන්න.

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

3) විකට රූපයක් යනු කුමක්ද? එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක හඳුනාගත හැකි වන පරිදි කාටූන් ශිල්පියා ඔහුගේ කුමන ලක්ෂණ තීව්‍ර කර පෙන්වයිද?

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

4) ඔබේ අදහස අනුව, කාටූන් ශිල්පියා කාන්තාවගේ රූපය කාටූනය මධ්‍යයේ තැබුවේ කුමක් නිසාද?

..........................................................................................

..........................................................................................

..........................................................................................

..........................................................................................

5) ලේබල් පිළිබඳ ඔබේ අවබෝධය මෙන්ම කාන්තාවගේ පිහිටුවීම භාවිත කරමින්, කාටූන් ශිල්පියා නරඹන්නාට පෙන්වීමට උත්සාහ කරන්නේ කුමක්ද යන්න පිළිබඳව ඔබේ අදහස දක්වන්න?

..........................................................................................

..........................................................................................

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

6) ඔබේ පෙළ පොතේ සඳහන් එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ ප්‍රධාන ප්‍රතිපත්ති කිහිපයක් සඳහන් කරන්න. ඔබ සිතන පරිදි, 'Ayurveda' සහ 'Western Medicine' යන ලේබල්වල භාවිතය මගින් කාටූන් ශිල්පියා යෝජනා කරන්නේ කුමක්ද?

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

7) මෙම කාටූනයේ නිර්මාණකරු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ තේරී පත්වීම දෙස බලන්නේ කෙසේද? කාටූන් ශිල්පියා තම දෘෂ්ටිකෝණය ප්‍රකාශ කිරීම සඳහා රූපකයක් භාවිත කරන ආකාරය පැහැදිලි කරන්න.

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

| | මූලාශ්‍රය A | මූලාශ්‍රය B |
|---|---|---|
| ප්‍රකාශයට පත් කළ දිනය සහ ස්ථානය | | |
| කාටූන් ශිල්පියා විසින් ඉදිරිපත් කරන ලද ප්‍රධාන අදහස් | | |
| කාටූන් ශිල්පියා තම අදහස් ප්‍රකාශ කිරීමට භාවිත කරන ක්‍රම | | |

8) කාටූන් දෙකෙහි ඉදිරිපත් කර ඇති දෘෂ්ටිකෝණවල වෙනස කුමක්ද? මෙම වෙනස එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතාගේ මැතිවරණය පිළිබඳව ඔබේ පෙළ පොතෙන් සපයන දැනුම වඩා ගැඹුරින් අවබෝධ කර ගැනීමට උපකාරී වන්නේ කෙසේද?

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

..............................................................................................................................................................................................................

**වැඩිදුර යෝජනා:**

මෙම පාඩම් දෙකෙන් බලාපොරොත්තු වන්නේ, ගුරුවරුන්ට පියවරෙන් පියවර තම පාඩම් සැලසුම් වැඩිදියුණු කිරීමට භාවිත කළ හැකි ආකෘතියක් සපයා දීමයි. මෙහි ඇති ප්‍රධාන කරුණු වන්නේ,

- ඉහත සඳහන් මූලික කුසලතා මත පදනම්ව, දෘශ්‍ය විශ්ලේෂණ ක්‍රියාවලිය අනුඛණ්ඩනය (breakdown) කර දැක්වීම

- සිසුන්ට ඔවුන්ගේ ඉතිහාස විෂය මාලාව සමග වඩාත් ගැඹුරින් සම්බන්ධ වීමට උපකාරී වන දෘශ්‍ය රූප සපයා දීම

- ගුරුවරයා විසින් මෙහෙයවන ලද සාකච්ඡා සහ මග පෙන්වීම් යටතේ සිසුන්ගේ ස්වාධීන චින්තනය සහ ලිවීම ඒකාබද්ධ කිරීමට වැඩ පත්‍රිකා භාවිතය

- මූලික දෘශ්‍ය කුසලතා කිහිප වරක් පුනරාවර්තනය කිරීම තුළින්, සිසුන්ට එම කුසලතා තම දෛනික අධ්‍යාපන ක්‍රියාකාරකම්වලට ඒකාබද්ධ කර ගැනීමට අවස්ථාව සැලසීම

ගුරුවරුන්ට, වඩා වැඩි අවධානයක් යොමු කරමින් පාඩම් සැලසුම් සකස් කිරීම සඳහා භාවිත කළ හැකි මෙවැනි බොහෝ අභ්‍යාස අන්තර්ජාලයෙන් සපයාගත හැකිය. සිංහල සහ දෙමළ භාෂාවෙන් අදාළ ඉගෙනුම් ද්‍රව්‍ය නොමැතිකම නිසා ගුරුවරුන්ට මෙම අභ්‍යාස ඔවුන්ගේ පන්ති කාමරයේ අවශ්‍යතාවලට ගැළපෙන අයුරින් සකස් කර, අපගේ විෂය මාලාවට සම්බන්ධ කර ගැනීමට සිදු වනු ඇත. ඒ සඳහා, ශ්‍රී ලංකාවේ පසුගිය දශකවල පුවත්පත්වල පළ වූ දේශපාලන කාටූන් යාවත්කාලීනව එකතු කර තබා ඇති Historiana.eu වෙබ් අඩවිය ගුරුවරුන්ට භාවිත කළ හැකි සුදුසු මූලාශ්‍රයක් වශයෙන් කටයුතු කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.